
# සංස්කෘත ගද්‍යය, ශ්‍රීමද්දණ්ඩි සහ දශකුමාරචරිත ගද්‍ය කාව්‍යය

- ශ්‍රාවස්තිපුර ශාන්තසිරි හිමි

<u>ගද්‍ය කාව්‍ය</u>

මිනිස් සන්තානයෙහි උපදින අපූර්ව වූ චිත්තාවන් නිර්මාණාත්මක භාෂාවකින් පැවසෙන විට කාව්‍ය නම් වෙයි. ඉපැරණි භාරතීය විචාරකයින් පැවසූයේ මෙම 'කාව්‍ය' යන සංඥාව ලැබීමට නම් නිර්මාණයක් රස, ධ්වනි, ගුණ. රීති, අලංකාර වැනි කාව්‍ය අංගයන්ගෙන් සමන්විත විය යුතු බව යි. එකී සංඥාව ගද්‍ය පද්‍ය වැනි ආකෘතිකමය සීමාවන් ගෙන් තොරව සෑම නිර්මාණාත්මක සාහිත්‍ය අංගයකට ම අභෙද්‍ය ලෙස භාවිතා කළ හැකි ය. පොදුවේ කාව්‍යය නාමය ලබන සංස්කෘත නිර්මාණ සාහිත්‍යය අන්තර්ගතය හා ආකෘතිය අනුව මෙලෙස වර්ගීකරණයකට ලක්කළ හැකි ය.




ඉහත දක්වෙනුයේ සංස්කෘත කාව්‍ය සාහිත්‍යයෙහි සියලු කාවය ප්‍රභෙදයන් පිළිබඳ ව ඉදිරිපත් කළහැකි වර්ගීකරණයේ මූලික අවස්ථාව යි. මෙම කාව්‍ය ප්‍රභේදයන් අතුරෙන් 'ගද්‍ය කාව්‍යය' යේ ලක්ෂණ කවරාකාර දැයි විමසා බලමු.

ගද්‍යය යන්නෙහි මූලය ගද් (-භාෂණෙ) ධාතුවයි. 'ගදාය සංවර්තනිකම් ගද්‍යම්' යන නිරුක්තිය අනුව කථා ව්‍යවහාරය පිණිස පවත්නේ ගද්‍ය වේ.

- අපාදඃ පද සන්තානො ගද්‍යම් - දණ්ඩි (කාව්‍යාදර්ශය)
- ඡන්දොරහිතං ගද්‍යම් - ඡන්දොමඤ්ජරි
- වෘත්තගන්ධොජ්ඣිතං ගද්‍යං - විශ්වනාථ (සාහිත්‍යදර්පණ)
- වෘත්තබන්ධොජ්ඣිතං ගද්‍යං - රාජශේකර (කාව්‍යමීමාංසා)

යන සෑම නිර්වචනයකින් ම පෙනී යන්නේ ගද්‍යයේ ආවේණික ලක්ෂණය හැම විට ම පාහේ පද්‍යය ඇසුරෙන් ම විමසීමට බඳුන් කර ඇති බවයි. 'පාද බෙදීමෙන්, විරිත්වලින් තොර වූ පදාවලිය ගද්‍යය වේ' යනු උක්ත නිර්වචනයන් ගේ අදහසයි. එකී ලක්ෂණ ද්වය හැරුණු විට ගද්‍යය පද්‍යයෙන් වෙනස් නොවන බැව් ඒ තුළින් ධ්වනිත වේ.

කාව්‍යාත්මක ගද්‍යයට ආවේණික ලක්ෂණය ලෙසින් ඔජොගුණ බාහුල්‍යය **(ඔජඃ සමාස භූයස්ත්ව මෙතද් ගද්‍යස්‍ය ජීවිතම්)** බව දණ්ඩීහු පවසති. පසු කාලීන ගද්‍ය රචකයන් උක්ත රීතියට කෙතරම් අනුගත වූයේ ද යන්න කාදම්බරී, වාසවදත්තා වැනි කෘති පරිශීලනයේ දී පෙනී යයි.

සංස්කෘත සාහිත්‍යය සතුව මහේශාක්‍ය වූ ගද්‍ය සාහිත්‍යයක් ඇති නමුත් එය ප්‍රමාණාත්මක ව ඉතා සුළු ය. නාමික ව ග්‍රන්ථ 15ක් පමණ වන අතර විද්‍යාමාන ප්‍රමාණය ග්‍රන්ථ 08ක් වේ. **'ගද්‍යං කවීනාං නිකෂං වදන්ති''** (- වාමන - කාව්‍යාලංකාරසූත්‍රවෘත්ති) යන ලෙසින් කවීත්වයේ උරගල, කවියා හඳුනාගත හැකි මිණුම් දණ්ඩ ගද්‍යය යැයි සැලකීමත්, පද්‍ය රචකයාට හිමිවන ඡන්දස නැමැති රැකවරණය අහිමිවීමත්, ගද්‍ය නිර්මාණ අල්ප වීමට හේතු විය.

විද්‍යමාන ගද්‍ය කාව්‍ය අතුරින් පළමුවැන්න සයවන සියසේ පමණ රචනා වූයේ ය යනු විද්වත් මතය යි. නමුත් ගද්‍යයේ ආරම්භය වේද යුගය දක්වා ම දිවෙන්නේ වෙයි. වෘතාන්තමය ගද්‍යයෙ ආරම්භය වේද යුගයෙහි, විශේෂයෙන් යජූර් වේදයේ බැව් **ඔල්ඩන් බර්ග්** සඳහන් කරයි. වෛදික සාහිත්‍යයෙහි සහ අන්‍යතර ප්‍රාක්තන ගද්‍යමය කොටස්,

- මුල් කාලයේ ඍචි අතර ගද්‍ය සංවාද තිබීම (ඕල්ඩන් බර්ග් - පුරූරවස් උර්විශී සංවාද)
- ගද්‍යයට සමීප අනුෂ්ටුභ් ආර්යා වෘත්ත භාවිතය.
- කෘෂණ ශුක්ල භේදයට හේතුව ගද්‍ය කොටස් නිසා
- කෘෂ්ණ යජූර් වේදයේ තෛත්තිරීය සංහිතාවේ හා කඨක මෛත්‍රායනී සංහිතාවේ ද ගද්‍ය කොටස් එයි.
- අථර්වන්හි vi වන කාණ්ඩය,15 අධ්‍යාය සපුරා ගද්‍ය, 16 අධ්‍යාය ගද්‍ය පද්‍ය මිශ්‍ර
- බ්‍රාහ්මණ ග්‍රන්ථයන්හි එන ශතපත, ච්‍යවන, පුරූවස්-උර්වශී පුවත්
- බ්‍රාහ්මණ ග්‍රන්ථවල ගද්‍ය බෙහෙවින් භාවිත වී ඇත. (වෘතාන්තමය ගද්‍ය රචනා)
  නිදඃ- ඓතරේය බ්‍රාහ්මණයේ ශුනඃශේඵ ආඛ්‍යානය. ශතපථ බ්‍රාහ්මණයේ ඡවන සහ පුරූරවස් උර්විශී ආඛ්‍යාන.
- බ්‍රාහ්මණ ග්‍රන්ථවල එන ගද්‍යවල විශේෂතා
  1 කෙටි සරල වාක්‍ය
  2 දීර්ඝ සමාස රහිත වීම
  3 ශ්ලේෂ වැනි සංකීර්ණ භාෂා ප්‍රයොග රහිත බව
  4 සාටෝපවත් නොවූ සරල රචනා ශෛලික් .
- උපනිෂද්වලදී වෘතාන්ත ගද්‍යයෙන්.
- බෘහදාරණ්‍යක, ඊශ, ඡාන්දොග්‍ය වැනි සම්පූර්ණ ගද්‍යමය උපනිෂද් (සත්‍යකාම ජාබලා, පුරූරවස් උරුවිශී, සනත්කුමාර නාරද සංවාදය.)
- යාස්කගේ නිරුක්ති, ශංකර, රාමනුජ, වාචස්පති මිශ්‍ර, ශවරස්වාමි ආදීන්ගේ ග්‍රන්ථ
- පතඤ්ජලීගේ මහාභාෂ්‍යය
- චරක, ශුශ්‍රැත වැන්නන්ගේ වෛද්‍ය ග්‍රන්ථ
- රුද්‍රදාමන්ගේ ධූනාගර් ගිරිනාර් ශිලා ලේඛනය (ක්‍රි. ව 150) ගද්‍යකාව්‍යයක් ලෙස (ස්ඵටලසුමධුරචිත්‍රකාන්තශබ්දසමයොදාරාලංකෘත ගද්‍ය පද්‍ය කාව්‍ය ප්‍රවීණෙන)
- ස්කන්ධගුප්තගේ භිතරි (ක්‍රි.ව.300), හරිශේනගේ අලහබාද් ප්‍රශස්ති (ක්‍රි.ව.345) යන ශිලාලේඛනයන්හි සාටෝපවත් ගද්‍ය කොටස්,
- බෞද්ධ සංස්කෘත සාහිත්‍යය.

- ජෛන කෘති ද.
- උපදේශ කථා.

යන ස්ථානයන්හි දැකගත හැකි අතර ඒවා ගද්‍ය රචනයේ ක්‍රමික සංවර්ධනය ප්‍රකට කරන අවස්ථා වේ. මේ හැරුනු විට නාම මාත්‍රික ව දක්නට ලැබෙන,

- වාසවදත්තා
- සුමනෝත්තරා
- භෛමරතී

} යන ආඛ්‍යායිකා ත්‍රය (- පතංජලී-මහාභාෂ්‍යය)

- බට්ටාර හරිචන්ද්‍රගේ ගද්‍ය බන්ධනය (බට්ටාරහරිචන්ද්‍රස්‍ය ගද්‍යබන්ධෝ නෘපායතේ -බාණ-හර්ෂචරිතය)
- ශීලා භට්ටාරිකා කවිඳිය ගේ කෘතිය ( ශීලා භට්ටාරිකා වාචී බාණෝක්තිෂු සා යදි -සූක්තමුක්තාවලී)
- අනංග ලේඛා (කාව්‍ය මාලාවෙහි උධෘත දෙකක් සහිත ව සඳහන් ය)

යන ගද්‍ය කාව්‍යයන් පසුකාලීන ගද්‍ය රචකයන්ට පුරෝගාමී මාර්ගෝපදෙශකත්වයක් ලබා දී ඇත. මෙලෙසින් ක්‍රමික ව සංවර්ධනයට පත් වූ ගද්‍ය රචනා ශෛලියේ මහගු ඵල විද්‍යාමාන වනුයේ සයවන සියවසෙන් පමණ පසු කලෙක ය.

- දණ්ඩී - දශකුමාර චරිතය
- බාණ - හර්ෂචරිත, කාදම්බරී
- සුබන්ධු - වාසවදත්තා
- ධනපාල - තිලකමඤ්ජරී
- සෝද්ධල - උදයසුන්දරීකථා
- වාමන - වේමභූපාලචරිත
- වාදීභසිංහ - ගද්‍යචින්තාමණී

යනු එකී ගද්‍ය කාව්‍ය වෘක්ෂයෙ සුරත් ඵල වේ.

දශකුමාර චරිත ගද්‍ය කාවය රචක ශ්‍රීමද්දණ්ඩි ආචාර්යයෝ සාහිත්‍ය ලක්ෂණවලින් පිරිපුන්, විද්‍යාමාන ප්‍රථම සංස්කෘත ගද්‍යකාව්‍ය රචකයා ලෙස බුහමන් ලබති. සාහිත්‍ය ක්ෂේත්‍රයට ඔහුගෙන් ලැබුණු මහාර්ඝතම දායාදය ''කාව්‍යාදශී'' නම් සුප්‍රකට කාව්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථය යි. සිංහල, පාලි සහ දෙමළ කාව්‍ය විචාර ශාස්ත්‍ර කෘතීනට මුල් වවා පමණක් නොව සංස්කෘත කාව්‍ය විචාරවාදයන් නව මගකට යොමුකළ කෘතියක් ලෙසින් එය හඳුන්වා දිය හැකි ය. ජනප්‍රවාදාගත තොරතුරුවලට අනුව ඒ ඇතුළු ව දණ්ඩීන් අතින් සම්පාදනය වූ ග්‍රන්ථත්‍රයකි.

"ත්‍රයෝග්න්‍යස් ත්‍රයො දෙවාස් ත්‍රයොවෙදාස් ත්‍රයො ගුණාඃ

ත්‍රයො දන්ඩිප්‍රබන්ධාශ්ච ත්‍රීෂු ලෝකේසු විශ්‍රුතාඃ" (-භාරාවලි)

යනු එබඳු පුවතකි. කාව්‍යාදශීය සහ දශකුමාරචරිතය දණ්ඩිකෘති බැව් නිශ්චිත ය. පෙර පුවතට අනුව දන්ඩිගේ තෙවැනි කෘතිය ජන්දොවිචිති නම් ඡන්දස් ශාස්ත්‍ර ග්‍රන්ථය හෝ අවන්තිසුන්දරී නම් ගද්‍යකාව්‍ය විය හැකි ය යනු විද්වත් මතය යි.

ස්වකීය නිර්මාණයන්හි පෞද්ගලික තොරතුරු කිසිවක් අන්තර්ගත නොකරන, දණ්ඩීන් පිළිබඳ දැකගත හැකි වන්නේ ග්‍රන්ථාන්තරාගත තොරතුරුවලින් පමණකි. ඒ සමග ම සාහිත්‍ය

ඉතිහාසඥයන් සත්‍යය ලෙස පිළිනොගන්නා ජනප්‍රවාද කිහිපයක් ද වේ. ග්‍රන්ථාන්තරාගත තොරතුරු අතර ''මාලතී ප්‍රොඤ්ජනී'' යෙහි සඳහන් එක්තරා ශ්ලෝකයකින් දන්ඩීන්ගේ මහා කවීත්වය ප්‍රකාශ වෙයි. එයට අනුව වාල්මීකි සහ ව්‍යාස මහා කිවියන්ට සමාන තැනක තබා දණ්ඩීන් පිළිබඳ පැවසේ.

''ජාතේ ජගති වාල්මීකෞ - කවිරිත්‍යභිධාභවෙත්

කවී ඉති තතෝ ව්‍යාසේ - කවයස්ත්වයි දණ්ඩිනි''(-මාලනි ප්‍රොඤ්ජනී)

ඒ සමග ම භොජප්‍රබන්ධයෙහි පැනෙන පුවත් කිහිපයකින් දණ්ඩි, භවභූති සහ කාලිදාස එක් ව කළ සමස්‍යාපූරණයන් පිළිබඳ තොරතුරු පැවසේ. මේ හැරුණු විට

කවිර්දණ්ඩි කවිර්දණ්ඩි කවිර්දණ්ඩි න සංශයඃ

කොයං බ්‍රෑහි තථාමුඪෙ - ත්වමෙවාහං න සංශයඃ

යන ලෙසින් සරස්වතිය යන කාලිදාස අතර ඇති වූ සංවාදයක් පිළිබඳ ජනප්‍රවාදගත ප්‍රවෘත්තිය ද දණ්ඩිගේ කාලය පිළිබඳ ඉඟියක් කරයි.

බොහෝ විද්වතුන් ප්‍රකාශ කරන්නේ දණ්ඩීන් ක්‍රි.ව. හත්වන සියවසට අයත්වන බවයි. "එම්. රංගාචාර්ය මහතා පවසන්නේ දණ්ඩින්ගේ සමය ක්‍රි.ව. 635 - 700 අතර බව යි"[1] ඇතමෙක් වාණ භට්ටයන්ට පූර්වකාලීන ව හයවන සියවසේ බව පවසති. සුබන්ධුගේ වාසවදත්තාවෙහි

''ඡන්දොවිචිතිරිව කුසුම විචිත්‍රාභිඃ''

''ඡන්දොවිචිතිරිව මාලනී සනාථා''

''ඡන්දොවිචිතිරිව භ්‍රාජමාන තනුමධ්‍යා'' යන ප්‍රකාශන්යන් දක ගත හැකිය. මෙහි සඳහන් ඡන්දො විචිතිය දණ්ඩින්ගේ කෘතිය නම් ඔහුගේ කාලය සුබන්ධුට පෙර බව නිශ්චිත ය.කාලිදාසයන්ට පසු කාලයක දණ්ඩීන් විසූ බව නිර්මාණ සංසන්දනයේ දී ද ප්‍රකට වෙයි.

රඝුවංශ viii. **59** - කාව්‍යාදර්ශය ii. **86**

ශාකුන්තල i. **23** - කාව්‍යාදර්ශ ii. **123**

යන පද්‍යයන් කිසියම් සාදෘශ්‍යතාවක් ප්‍රකට කරන අතර විචාරකයන් නිර්මාණකරුවන්ගේ නිදසුන් උපුටා දක්වන්නේ ය යන උපකල්පනය මත පිහිටා දණ්ඩීන් කාලිදාසගෙන් උපුටා දැක්වූයේ ඔහු පසුකාලීන නිසා බැව් පැවසිය හැකිය. මේ බව තහවුරු කෙරෙන තවත් සුප්‍රකට අවස්ථාවක් වෙයි. ඒ කාව්‍යාදර්ශයේ ප්‍රසාද ගුණ නිදසුන යි. එය කාලිදාසගේ අභිඥාන සාකුන්තලයේ ප්‍රථමාංකයේ ශ්ලෝකපාදයකට සම්බන්ධ ය.

"සරසිජමනුවිද්ධං ශෛවලෙනාපි රම්‍යං

මලිනමපිහිමාංශෝර් **ලක්ෂ්ම ලක්ෂ්මීං තනෝති**" (-අභිඥානශාකුන්තල i.17)

ප්‍රසාදවත් ප්‍රසිද්ධාර්ථ - රින්දොරින්දීවරද්‍යුතිඃ

**ලක්‍ෂම ලක්‍ෂමීං තනෝතී**ති - ප්‍රතීතිසුභගං වචඃ (-කාව්‍යදර්ශ i. 45)

යනු උක්ත අවස්ථාව යි. මේ කරුණු තුළින් දණ්ඩි කාලිදාසයන්ට පසුකාලීන බැව් මැනවින් පෙනී යයි. ඒ සමග ම දණ්ඩීන් විසූ සමය ලෙසින් ගත හැකි කාලපරිච්ඡේදයේ මෑත සීමාව බාණගේ කාලය බැව් පැවසිය හැකි ය. එයට හේතු වන ප්‍රධානතම කරුණ නම් භාෂා සහ රචනා ශෛලිය අනුව බාණ සහ සුබන්ධු දෙදෙනාගේ ගද්‍ය කාව්‍යයන් දණ්ඩීන්ට පසු අවධියක රචනා වූ බැව් විචාරකයන් අවිවාදයෙන් ම පිළිගෙන තිබීම යි. ශ්‍රී හර්ෂ රජ සමයේ එනම් ක්‍රි.ව. හත්වන සියවසේ බාණයන් විසුවේ ය යන්න ඓතිහාසික සාක්‍ෂ්‍යමත තහවුරු ව පවත්නා හෙයින් දණ්ඩීන් ද ක්‍රි.ව. පස්වන සියවසේ පසු කාලය සහ හයවන සියවසේ මුල් කාලය තුළ විසුවේ යැයි පිළිගැනීම සාධාරණ ය.

දණ්ඩීන් විසූ පෙදෙස පිළිබඳ තොරතුරු සෙවීමට ද පිටුවහලක් වනුයේ ඔහුගේ නිර්මාණ පමණකි. කාව්‍යාදර්ශයේ දී වෛදර්භි රීතිය විශේෂ කොට දැක්වීමත් දශකුමාර චරිතය උක්ත රීතියට

අනුව රචනා කොට තිබීමත් ඇතමෙක් දණ්ඩීන් විදර්භදේශයට අයත් කිරීමට හේතු වේ. ''හරිශෙන දෙවශර්මන්'' ට අනුව දණ්ඩීන් නෛෂ්ඨික (-බ්‍රහ්මචාරි) බෞද්ධ භික්ෂුවකි. කාව්‍යාදර්ශයේ න්‍යාය විරෝධයට දක්වන නිදසුන.

"සත්‍යමේවාහසුගතඃ - සංස්කාරා න විනශ්වරාන්

තථාහි සා චකොරාක්ෂි - ස්ථිතෛවාද්‍යාපි මේ හෘදි" (කාව්‍යාදර්ශය iii. 174)[2]

යන උද්ධෘත පද්‍යය එයට හේතු කොට ගනියි. න්‍යාය විරෝධයට නිදසුන් ලෙසින් දක්වන මෙයින් ප්‍රධානතම බෞද්ධ දාර්ශණික සංකල්පයක් වන අනිත්‍යය පිළිබඳ ව සාකච්ඡා වීම එයට හේතුව යි. නමුත් දශකුමාර චරිතයේ ආරම්භක පද්‍යයෙන් හැගෙන්නේ ඔහුගේ හින්දු භක්තික බව යි.

දණ්ඩීන් පිළිබඳ හෙළිවන මෙම තොරතුරු ස්වල්පය විමසීමෙන් අනතුරු ව ඔහුගේ විශිෂ්ට ගද්‍යකාව්‍ය වන දශකුමාර චරිතය පිළිබඳ ව විමසා බැලීම වටී. සේනානායක මහතා පවසන්නේ දසකුමාර චරිතය ''ආඛ්‍යායිකා'' නම් ගද්‍ය ප්‍රභෙදයට අයත් කාව්‍යයක් බව යි.[3] ඒ එහි ඓතිහාසික පුවතක් අන්තර්ගත වීම නිසා නම් නො වේ. දශකුමාර චරිතය කාල්පනික වූ අතිශය අද්භූත ආශ්චර්යවත් සිදුවීම් බහුල රචනයකි. එසේ තිබිය දී මෙය ආඛ්‍යායිකාවකැයි පවසන්නේ කාව්‍ය නායකයන් විසින් ම තම තමන්ගේ කතා පුවත් පැවසීම සහ සමකාලීන සමාජ තොරතුරු යථාරූපී ව ඉදිරිපත් කරන නිසා විය හැකි ය.

දණ්ඩීන් සිය කථා තේමාව ගුණාඪ්‍යගේ බෘහත් කථාවෙන් ලබාගන්නට ඇති බව ''බොහෝ දුරට ස්ථිර කොට කිවහැකැ" යි කීත් පවසයි.[4] නරවාහනදත්ත සහ සමිතුරන් පිළිබඳ බෘහත්කථා ප්‍රවෘත්තිය දශකුමාර චරිතය සමග හොඳින් සසැදෙතැයි ඔහු ප්‍රකාශකරයි.

රජවාහන ප්‍රමඛ කුමරුන් දස දෙනෙකු පිළිබඳ පුවත් ඇතුළත් නිසා ග්‍රන්ථ නාමය අන්වර්ථ ය.

''ප්‍රමතිර්මන්ත්‍රගුප්තශ්ච - මිත්‍රගුප්තශ්ච විශ්‍රැතඃ

පුෂපෝද්භවඃ සෝමදත්තෝථපාලෝ රාජවාහනඃ

උපහාරොපහාරාශ්ච වර්‍යාදශ කුමාරකාඃ

යතු උක්ත දශකුමාරයන්ගේ නාමයෝ ය. මගධරට රාජ හංස රජු සහ ඇමතිවරුන්ගේ පුතුන් වන මොවුහු සිය පියවරුනට අහිමිවූ රාජ්‍යයත් කිර්තියත් නැවත ලබා ගැනීමෙහි දී අත්විඳින අපූර්ව සිදුවීම් කථා මාලාවක් ලෙසින් මෙහි ඇතුළත් වේ.

01. කුමාරෝත්පත්ති

02. ද්විජෝපකෘති

03. සෝමදත්ත චරිත

04. පුෂ්පෝද්භව චරිත

05. අවන්තිසුන්දරී පරිණය

මේ දශකුමාර චරිත පූර්ව පීඨිකාවේ ඇතුළත් උච්ඡ්වාස පහ යි. උත්තර පීඨිකාවෙහි උච්ඡ්වාස අටකි.

01. රාජවාහන චරිත

02. අපහාරවර්ම චරිත

03. උපහාරවර්ම චරිත

04. අර්ථපාල චරිත

05. ප්‍රමති චරිත

06. මිත්‍රගුප්ත චරිත

07. මන්ත්‍රගුප්ත චරිත කණකලේඛා

08. විශ්‍රැත චරිත

උත්තරපීඨිකා නිමි යනුවෙන් කෘතිය නිමවෙයි.

පූර්ව පීඨිකා, චරිතභාග, සහ උත්තරාග යනුවෙන් ඇතැම් විචාරකයන් කොටස් තුනකට බෙදීමට අභිමත ය. ඒ අනුව චරිතභාගයෙහි දසකුමාරවරුන් පිළිබඳ කථාපුවත් අන්තර්ගත ය. එවිට පූර්ව පීඨිකාවට ප්‍රථම අධ්‍යාය දෙක පමණක් අයත් වන අතර උත්තර පීඨිකාවට අයත් වනුයේ විශ්‍රැත චරිතයෙන් පසු රචිත ඡේද කිහිපය පමණක් වෙයි. මෙකී බෙදීම එතරම් තර්කානුකූල හෝ බුද්ධිගෝචර බෙදුමක් නොවේ.

මෙහි පූර්ව පීඨිකාව භාෂාශෛලිය, රචනා සම්ප්‍රදාය සහ කථාපුවත්වල සිදුවීම් සම්බන්ධයෙන් උත්තර පීඨිකාවෙන් වෙනස්වන තැන් දක ගත හැකි ය. ඒ හේතු කොට ගෙන එකී කොටස් දෙක 'රචකයන් දෙදෙනෙකු අතින් සම්පාදනය වූවේයැ' යි ඇතමෙක් පවසතත් එය මෙහි කතෘත්වය දණ්ඩීන්ට අහිමි කිරීමට තරම් ප්‍රබල මතයක් නො වේ. සුළු සුළු වෙනස්කම් සහිත ව නමුත් සම්පූර්ණ කෘතියෙහි කතෘත්වය දණ්ඩින්ට පවරා දෙමින් සේනානායක මහතා එහි භාෂා ශෛලිය පිළිබඳ මෙසේ කියයි. "මෙහි භාෂාව සරල ය. වෛදර්භී ශෛලිය ප්‍රධාන වශයෙන් උපයුක්ත වුව ද ගෞඩී ශෛලිය ද ඇතැම් තැනක දක්නට ලැබේ. කාදම්බරියේ තරම් දීර්ඝ සමාස නොදක්වීම නිසා කියවන්නන්ගේ ආස්වාදය උසිගන්වන සුලු ය."[5] මෙම අදහසට කීත් ද එකඟ වෙයි. "හෙතෙම සෞන්දර්‍ය්‍යය, ශබ්ද සමතාවය හා භාවයෙහි සාර්ථක ප්‍රකාශය නිපදවයි"[6] යනුවෙන් පවසන කීත් " දණ්ඩිනඃ පද ලාලිත්‍යං" යන භාරතීය විචාරක මතය තහවුරු කරයි.

''මණිමය මණ්ඩන මණ්ඩල මණ්ඩිත සකලලොක ලලනාකුල ලාලාටභූතා කන්‍යකා කාචන විනීතානෙක සඛීජනා අනුගම්‍යමානා''

''ශාශිරම්ද මින්දිවරාරාවින්දමකරන්ද බින්දු චන්දු කොත්තරම්''

''ඉන්දිවරකහ්ලාරකෙවාර රාජිවරාජි කෙලිලෝල''

''කුමාරා මාරාභිරාමා රාමස්ත්‍රපෞරුෂා රූෂා භස්මීකෘතාරයො රයොපහසිත

සමීරණා රණාභියානෙන යානෙනාභ්‍යුදයාශංසං රාජානමකාර්ෂුඃ''

වැනි පාඨයන් දන්ඩීන්ගේ ලාලිත්‍යවත් රචනා ශෛලිය ප්‍රකට කරයි.

මන්ත්‍රගුප්ත - කණකලේඛා පුවත සඳහන් සත්වන උච්ඡ්වාසය දන්ඩීන්ගේ සුවිශේෂී වාක් කෞශල්‍යය ප්‍රකට කරයි.

ප්‍රියාව විසින් දඩිව සිප වැලඳගැනීමෙන් හිංසනයට පත් තුවාළ වූ දෙතොල් සහිත මන්ත්‍රගුප්ත සිය මිතුරන් හමුවේ දොඩමලු වන්නේ ඕෂ්ටජ වර්ණ රහිත ව ය.

''නිජ නිලය නිලීන නිඃශෙෂජනෙ නිතාන්ත ශිතෙ නීශීතෙ සනතර ශිල ශාඛාන්තරාල නිරභ්‍රාදිනි නෙත්‍ර නිංසනී නිද්‍රාං නිගෘහ්ණන්''

වැනි පාඨවලින් සමලංකෘත එකී අවස්ථාව දණ්ඩීන්ගේ ප්‍රතිභා ශක්තියත් වර්ණනා චාතුර්යයත් භාෂා නිපුණතාවත් මැනවින් ප්‍රකට කරයි.

ඉතා ම කලාතුරකින් යෙදෙන පද්‍යයක ද දණ්ඩින්ගේ කවිත්වය ප්‍රකට ව පෙනේ.

"සුභග කුසුම සුකුමාරං - ජගදනවද්‍යං විලොක්‍ය තව රූපම්

මම මානසමභිලෂති ත්වං - චිත්තං කුරු තථා මෘදුලම්"

- මනහර වූ වර්ණනා
- තාත්වික හා මායාමය සිදුවීම්වල සම්මිශ්‍රණය

- විවිධ දුසිරිතයෙහි නියලුණු සමාජයේ විවිධ ස්ථර නියෝජනය කරන්නන් පිළිබඳ පුවත්
- ජනකථාවන්හි ආභාෂය

ආදිය දශකුමාර චරිතයෙහි දක්නට ලැබෙන තවත් විශේෂ ලක්‍ෂණ කිහිපයකි. මෙහි දී දුසිරිතෙහි නියැලුණුවුන් කාව්‍ය නායකයන් ලෙස යොදාගැනීම පිළිබඳ විශේෂයෙන් විමසා බැලිය යතු ය. සොරකම, වංචාව, කපටිකම, කූට උපාය යෙදීම, සූදු කෙලීම, පරස්ත්‍රී සේවනය වැනි දුස්සිරිත් වල නියැලුණු අය එබඳු විෂයන්හි ප්‍රවීණත්වයක් උසුලන්නන් පිළිබඳ මෙහි සඳහන් වන තරම කෙතරම්දැයි පවසතොත් මෙය සොරකම පිළිබඳ කථා ග්‍රන්ථයක් (Romance of Roguery) ලෙස හැඳින් වීමට දාස්ගුප්තා සහ දේ (S.N. Das Gupta-S.K De) යන භාරතීය විද්වත්හු කැමති වෙත්.[06] පෙර කී කාව්‍ය නායකයන් පිළිබඳ කරුණු දණ්ඩි කාව්‍යාදර්ශයෙහි දී සඳහන් කරන ''සදාශ්‍රය'' නම් කාවය ලක්‍ෂණය සමග පරස්පර විරෝධීතාවක් දක්වයි. මේ පිළිබඳ අදහස් දක්වන කීත් සමච්චල් සහගත ස්වරයෙන් පවසන්නේ ''නියෝගය සහ ක්‍රියාකාරිත්වය අතර පවත්නා නොහික්මුණු වෙනසත්, තරුණ අපරිනත කවිත්වයත්''[7] එම තත්වයට හේතුවන්නට ඇති බවයි.

දසකුමාර චරිතයේ භාෂාව සේම වර්ණනාවන් ද සරල ය. බාණ, සුබන්දු වැනි රචකයින් සමග සසඳා බලන විට ඒ බැව් මැනවින් ප්‍රකට වේ. දීර්ඝ සමාස භාවිතයේ ගද්‍ය රචකයා සතු අයිතිය පවා භාවිත ව ඇත්තේ සීමිත ව ය. එනිසා කථා රසයට බාදා නොවෙයි. සමකාලීන සමාජ සාමායික තොරතුරු ද අන්තර්ග්‍රහණය කරමින් කථා රසයෙන් අනූන ව රචිත දසකුමාර චරිතය ප්‍රාරම්භක කෘතිය ලෙස නොව සංස්කෘත ගද්‍ය කාව්‍යයන් අතර රසවත් ම කෘතිය ලෙස ඇගයිය හැකි ය.

ආන්තික සටහන්

---

1 සේනානායක, ජී. එස්. බී. සංස්කෘත සාහිත්‍යය, 430 පි.
2 කාව්‍යාදර්ශය - වැලිවිටියේ ප්‍රේමරත්න සංස්. 340 පි.2001 කොළඹ
3 සේනානායක, ජී. එස්. බී. සංස්කෘත සාහිත්‍යය, 430 පි.
4 කීත් ඒ.බී. සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය (පරි. සේනානායක) 447 පිට 1965 කොළඹ
5 සේනානායක 432 පිට
6 තිලකසිරි ජයදේව සංස්කෘත කාව්‍ය සාහිත්‍ය 185 පිට දෙවන මුද්‍රණය 1999 කොළඹ
7 කීත් 457 පිට